## පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ , පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2010 වර්ෂයේ සිට පැවතෙන රු. 267,670 ක දේපළ ණය සහ රු. 584,427 ක් වූ ආපදා ණය 2012 දෙසැම්බර් 31 වන විටත් අය නොවී පැවතුණි.

##### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් ගිණුම් විෂයන් ඉදිරියෙන් දක්වා ඇති ලේඛන හා ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---:|---|
| | රු. | |
| පුස්තකාල පොත් | 153,593 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| අත්තිකාරම් | 2,468,900 | ව්‍යාපෘති අත්තිකාරම් ලේඛනය |

##### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූලතාවය නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2011 අප්‍රේල් 18 දිනැති අංක PAYE / Tax /01/ 2011 දරන දේශීය ආදායම් | උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී ප්‍රසාද දීමනා හා වෙනත් දීමනා ආදිය සළකා බැලිය යුතු |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තු චක්‍රලේඛය | වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ.) | |
| | (i) මු.රෙ. 135 | විධිවිධාන ප්‍රකාරව මූල්‍ය හා බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 757 | එක් එක් අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛණ පවත්වා නොතිබුණු අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වාර්තාවල ශේෂය සැසඳීමක් සිදුකර භාණ්ඩවල නිවැරදිතාවය තහවුරු කර නොතිබුණි. |
| | (iii) මු.රෙ. 1645(ආ) , (ඇ) සහ 1646 | දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ පවත්වා ගැනිම හා විගණකාධිපති වෙත එවීම මු.රෙ. පරිදි කටයුතු කර නොතිබුණි. |
| | (iv) මු.රෙ. 1645(අ) සහ 1647(අ) | ක්‍රමවත් ලෙස සම්පූර්ණ කළ වාහන ලොග් සටහන් පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| | (v) මු.රෙ. 1647(ඉ), මු.රෙ. 802 | මේ අනුව වාහන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | ආයතන සංග්‍රහයේ ii වැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය | ආයතනයේ මූල්‍ය උපදේශන තනතුර සඳහා 2007 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා නිත්‍ය නිලධාරියකු බඳවා නොගෙන වැඩ බැලීමේ නිලධාරියකු පත්කර තිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ | |
| | (i) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පසුගිය වසර 05 තුල රු. 4,175,056 ක් වටිනා පරිගණක උපාංග මිලදී ගෙන තිබුණද චක්‍රලේඛය ප්‍රකාරව ලේඛණ ගත කර නොතිබුණි. |
| | (ii) 2008 දෙසැම්බර් 31 දිනැති අංක | ආපදා ණය ලබාදීමේදී උපරිම ණය සිමාව මාස 10 |

| | | |
|---|---|---|
| | 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2013 ජනවාරි 31 දිනැති අංක 157(1) දරන ජාතික අයවැය චක්‍රලේඛය. | ක මූලික වැටුප හෝ රු.250,000 යන දෙකෙන් අඩු අගය සැළකිය යුතු වුවත් නිළධාරින් තිදෙනකුට රු.293,000 සිට රු. 435,000 දක්වා පරාසයක ආපදා ණය ලබා දී තිබුණි. එම සීමාවන් ඉක්මවා ලබාගත් ණය ආපසු අයකර ගැනීමට ජාතික අයවැය චක්‍රලේඛය අනුව නියම කළ ද එසේ කර නොතිබුණි. |
| (iii) | 2007 ජනවාරි 10 දිනැති අංක එස් එල් අයි එල් ජී 104 දරන අභ්‍යන්තර චක්‍රලේඛය. | එක් සම්පත් දායකයකු හට දිනකට දේශන පැවැත්විය හැකි උපරිම පැය ගණන 03 ක් වුවද පැය 08 ක් බැගින් දේශන පවත්වා දීමනා ලබාගෙන තිබුණි. |

**1.2.4** ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 11.1.5 වගන්තිය ප්‍රකාරව එක්වරක් පමණක් ගෙවිය හැකි දේපළ ණය, උපදේශකවරයෙකුට දෙවරක් ගෙවා තිබූ අතර මෙලෙස ගෙවා තිබූ මුදල 2005 දී රු. 700,000 ක් හා 2012 දී රු. 500,000 ක් විය.

(ii) 2005 මාර්තු 31 දිනැති අංක 8/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව දේපළ ණය බැංකු මාර්ගයෙන් ගෙවිය යුතු වුවද 2005 සිට 2012 දක්වා කාලය තුලදී නිලධාරින් 08 දෙනෙකු සඳහා රු. 6,742,600 ක දේපළ ණය ආයතනය විසින් ලබා දී තිබුණි.

(iii) රු.1,447,800 ක දේපළ ණයක් ඉල්ලුම් කළ නිළධාරියෙකුට ඉල්ලුම් කරන ලද ණය මුදලට වඩා රු. 100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2000 ජනවාරි 11 අංක පීඑෆ්/පීපී/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් ආයතනයේ කාර්යමණ්ඩලයට මාර්ග ක්ෂේත්‍ර සහයක ව්‍යාපෘතිය මඟින් ආයතනයට ලබාදුන් පැවරුමේ කටයුතු සඳහා පහත පරිදි දීමනා ගෙවා තිබුණි.

(i) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය වැරදි ලෙස යොදාගනිමින් ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු සඳහා වැටුපෙන් 1/3 දීමනාවක් ලෙස රු. 464,879 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ලබා ගෙන තිබුණි.

(ii) මාර්ග සිතියම් සකස් කිරීම සඳහා ප්‍රාදේශිය සභා 57 ක සිතියමකට රු. 7,000 බැගින් රු. 399,000 ක් ලබාගෙන තිබුණි.

(iii) ව්‍යාපෘති පැවරුමට අදාලව ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්විමේ දී සම්පත් දායකයන් හට පැයකට රු. 2,500 බැගින් පැය 92 සඳහා රු.230,000 ක් ගෙවා තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,467,357 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,882,054 ක අතිරික්තයක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.6,349,411 ක පිරිහීම සඳහා මෙහෙයුම් ආදායම සියයට 23 කින් එනම් රු.15,508,693 කින් අඩුවීම හා එයට සාපේක්ෂව මෙහෙයුම් වියදම සියයට 14 කින් එනම් රු.9,159,281 කින් පහල යෑම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සභිකයින්, නිලධාරින් හා සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස ඉටුකිරීමට හැකි වන පරිදි වැඩමුළු හා පුහුණු පාඨමාලා පැවැත්විම සඳහා වාර්ෂික අයවැය මගින් රු. 14,875,000 ක මුදලක් වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා රු. 16,580,717 ක් වැය කර තිබුණ ද, ආයතනය සැලසුම් කළ කාර්යය සාධනය සිදු වී නොතිබුණු බව පහත අංශ වාර්තා අනුව නිරීක්ෂණය විය.

| අංශය | ඇස්තමේන්තුගත | | | තථ්‍ය | | | තථ්‍ය වියදම ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස | තථ්‍ය වැඩමුළු සංඛ්‍යාව ඇස්තමේන්තුගත වැඩමුළු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| | වැඩමුළු සංඛ්‍යාව | සහභාගීත්ව සංඛ්‍යාව | ප්‍රතිපාදන | වැඩමුළු සංඛ්‍යාව | සහභාගීත්ව සංඛ්‍යාව | වියදම | | |
| | | | රු. | | | රු. | % | % |
| මානව සම්පත් | 23 | 600 | 2,125,000 | ඉදිරිපත් නොකෙරුණි | | 2,332,565 | 109.8 | - |
| ඉංජිනේරු | 28 | 795 | 2,125,000 | 10 | 351 | 401,231 | 18.7 | 35.7 |
| පොදු කළමනාකරණ | 19 | 760 | 2,125,000 | 15 | 916 | 1,852,065 | 87.15 | 79 |
| භෞතික සැළසුම් | 14 | 560 | 2,125,000 | 14 | 738 | 1,598,391 | 75.2 | 100 |
| මූල්‍ය කළමනාකරණ | 57 | 2,280 | 2,125,000 | 38 | 984 | 2,263,018 | 106.5 | 67 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නීති | 09 | 450 | 2,125,000 | 21 | 1,005 | 2,552,814 | 120 | 253 |
| පර්යේෂණ | 07 | - | 2,125,000 | 06 | - | 2,753,817 | 129.6 | 86 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඉංජිනේරු අංශයේ ඇස්තමේන්තුගත වැඩමුළු හා ක්‍රියාකාරකම් 28 න් 10 ක් පමණක් ඉටුකර තිබූ අතර, එහි කාර්ය සාධනය සියයට 35.7 ක පහළ මට්ටමක පැවතුණි.

- මූල්‍ය කළමනාකරණ අංශයේ පැවැත්විය යුතු වැඩමුළු 57 න් 38 ක් පමණක් පවත්වා තිබූ අතර, පුහුණුව ලබා දියයුතු සිසුන් 2280 ක් සඳහා ඇස්තමේන්තුගත රු. 2,125,000 ක් ඉක්මවා රු. 138,018 ක් වැඩියෙන් වැය කර සිසුන් 984 කට පමණක් පුහුණුව ලබාදී තිබුණි.

- මානව සම්පත් කළමනාකරණ අංශයේ ඇස්තමේන්තුගත වැඩමුළු හා ක්‍රියාකාරකම් සංඛ්‍යාව 23 ක් වූ අතර, සත්‍ය වශයෙන් පැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව හා සහභාගී වූ සංඛ්‍යාව කොපමණදැයි පරීක්ෂා කිරීම සඳහා ප්‍රගති වාර්තාව හා වැඩසටහන්වලට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීය. ගිණුම් අංශයේ වියදම් විස්තරය අනුව ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.207,566 ක් වැය කර තිබුණි.

- පර්යේෂණ අංශයේ වැඩමුළු 07 ක් පැවැත්වීම සඳහා රු. 2,125,000 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද, වැඩමුළු 06 ක් අවසන් කිරීම සඳහා රු. 2,753,817 ක් වැයකර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විවිධ ප්‍රදේශවල පැවැත්වූ වැඩසටහන් 13 ක් සඳහා රු.70,728 ක ප්‍රවාහන ගාස්තු ගෙවා තිබුණු අතර ප්‍රවාහන වියදම අඩුකර ගැනීමට පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් සම්පත්දායකයින් තෝරා දේශක මඩුල්ලක් සකස් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම්වලදී යෝජනා කර තිබුණද, එය මෙතෙක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

2008 වර්ෂයේ රු.324,990 කට මිලදී ගෙන තිබූ ත්‍රීවිල් රථය 2014 මැයි දක්වාම ප්‍රයෝජනයට නොගෙන පරිශ්‍රයේ නිශ්ක්‍රියව තිබූ අතර එම වාහනය සඳහා 2012 වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය ලබාගෙන තිබුණි.

3.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත්ව තිබූ රු.72,880 ක් වටිනා ජංගම දුරකථන 03 ක් හා වාර්තාවේ සටහන්ව තිබූ කැමරා 02 ක් භෞතික සමීක්ෂණ අවස්ථාවේදී ආයතනයේ නොතිබුණි.

(ආ) භෞතික පරීක්ෂණ අවස්ථාවේ රු.24,390 ක් වටිනා බ්‍රීෆ් කේස් 02 ක් හා රු. 122,500 ක් වටිනා ලැප්ටොප් එකක් ආයතනයෙන් ඉවත්ව ගිය නිලධාරින් දෙදෙනෙකු විසින් රැගෙන ගොස් තිබුණි.

3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පහත දැක්වේ. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව පවත්වා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්තය හා (පුරප්පාඩු) සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| මාණ්ඩලික | 10 | 08 | (02) |
| මාණ්ඩලික නොවන | 26 | 15 | (11) |
| සුළු සේවක | 06 | 11 | 05 |

**4.** ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු බව සඳහන් වුවද, ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 ජුලි 30 දිනය. එනම් මාස 05 ක් ප්‍රමාද වීය.

5. පද්ධති පාලන

විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු පිළිබඳව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වරින් වර වාර්තා කරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ඉන්වෙන්ට්‍රි ලේඛන හා ගබඩා පාලනය

(ආ) ණය ලබාදීම හා ණය ලිපිගොනු නඩත්තුව

(ඇ) වැඩමුළු පැවත්වීම හා දීමනා ගෙවීම

(ඈ) වාහන පාලනය හා ලේඛන නඩත්තුව